**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අගෝස්තු සිට ඉකුත් වර්ෂයේ සැප්තැම්බර් දක්වා කාලයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී, ගෙවා තිබුණු රු.550,919 ක හිඟ වැටුප් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සහ ප්‍රතිපූර්ණය ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වර්ෂයට අදාළ වියදම පමණක් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉදිරි වර්ෂය තුළ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.829,211 ක ණය වාරිකය දිගු කාලීන වගකීම් යටතේ ශේෂ පත්‍රයේ දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ඉදිරි වර්ෂය තුළ ගෙවිය යුතු ණය වාරික ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කළ යුතුය |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් විෂයයන් 07 කට අදාළ ගිණුම් අනුව ශේෂ හා උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.2,418,187 ක වෙනසක් පැවතුණි. | ලේඛන සකස් කිරීමේ දී අතපසුවීමකින් ශේෂ මඟ හැරී ඇති බව හා අනෙකුත් ලේඛන පරීක්ෂා කර නිවැරදි කරන බව | වෙනස්කම් සඳහා හේතු හඳුනා ගෙන නිවැරදි කළ යුතුය |

1.7 අනුකූල නොවීම්

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 158 (1) වගන්තිය | අදාළ නිශ්චල හෝ චංචල දේපළ තහනමට ගෙන, ඒවා විකිණීමෙන් රු.5,401,447 ක් වූ හිඟ වරිපනම් බදු ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළමු කාර්තුව අවසාන වීමට පෙර ජංගම සේවා පැවැත්වීම හා රතු නිවේදන යැවීමට කටයුතු කළ බවත්, දේපළ තහනම් කිරීමට කටයුතු කරමින් පවතින බව | පනත ප්‍රකාරව කටයුතු කර බදු මුදල් අය කර ගත යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.39,623,149 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.42,543,077 ක් විය.

2.2 මූල්‍ය පාලනය

----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 130 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවකට ලැබී ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු සියලු මුදල් අනුමත කළ බැංකුවක "ප්‍රාදේශීය සභා අරමුදල" යන අභිධානයෙන් යුත් ගිණුමකට බැර කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ දෙල්තොට උපකාර්යාලයෙන් රැස් කර ගන්නා ආදායම වෙනම ඉතුරුම් ගිණුමක තැන්පත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට රු.9,760,980 ක ශේෂයක් එම ගිණුමේ ඌන උපයෝජිතව පැවතුණි. | නිල ජංගම ගිණුමට මාරු කර එම මුදල ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | සභාව සතු මුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය |

2.3 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| i. | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.5,971,994 ක වරිපනම් බදු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ වසර 05 ඉක්ම වූ රජයේ වරිපනම් ඒකක 29 කින් අය විය යුතු මුදල රු.871,480 ක්, වසර 05 ට වැඩි එක් වරිපනම් ඒකකයක හිඟය රු.10,000 ඉක්ම වූ වරිපනම් ඒකක 17 කින් අය විය යුතු රු.814,965 ක් ඇතුළත්ව තිබුණි. | අදාළ ආයතන වෙත හිඟ ශේෂයන් පිළිබඳ ලිපි, සිහි කැඳවීම් මෙන්ම, වසර 05 ට වැඩි හිඟ ශේෂයක් සඳහා සවිස්තරාත්මක ශේෂයන් පිළිබඳ දන්වා යවා ඇති අතර, එයින් රු.225,000 ක මුදලක් අය කර ගෙන ඇති බව | හිඟ වරිපනම් බදු අය කළ යුතුය |
| ii. | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඒකක 395 කින් අය විය යුතු රු.1,301,342 ක අක්කර බදු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ වසර 05 ට වැඩි ඒකක හිඟය රු.1,000 ඉක්ම වූ බදුකරුවන් 316 දෙනෙකුගෙන් අය විය යුතු ශේෂය රු.1,030,564 ක් ඇතුළත්ව තිබුණි. | දීර්ඝ කාලයක් අක්කර බදු අය වී නොමැති බවත්, ඒ නිසා සාවද්‍ය ලෙස බිල් කර ඇති ගාස්තු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කර ඇති බවත්, ඒ අනුව රු.621,167 ක් කපා හැරීමට යොමු කර ඇති බව සහ ඉදිරියේ දී ජංගම සේවා පවත්වා හිඟ මුදල් අය කර ගන්නා බව | හිඟ අක්කර බදු අය කර ගත යුතුය |
| (ආ) | ජල බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.16,937,738 ක හිඟ ජල ගාස්තු අගයෙන් වර්ෂය තුළ දී, රු.14,706,833 ක් හෙවත්, සියයට 86 ක් අය කර නොතිබුණු අතර, අක්‍රීය ජල ව්‍යාපෘතියක රු.1,351,613 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ රු.18,100 ක් හෙවත්, සියයට 01 ක් පමණක් අය කර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජංගම සේවා හා ජල සම්බන්ධතා විසන්ධි කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත්, ඉදිරියේ දී ඒ අනුව කටයුතු කර ගාස්තු අය කර ගන්නා බව | හිඟ ජල ගාස්තු අය කර ගත යුතුය |

(ඇ) කඩ කුලී

----------

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ 06 කින් අය විය යුතු රු.720,228 ක් ඇතුළුව කඩ කාමර 84 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ කඩ කුලිය රු.1,396,710 ක් වූ අතර, එම මුදල් අය කර නොතිබුණි. | දැනට අය නොවී පවතින කුළී සඳහා නඩු පවරා ඇති අතර, හිඟ ශේෂයන් අය වෙමින් පවතින අතර, අනෙකුත් හිඟ ණය ශේෂයන් අය කර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදු කර ඇති බව | හිඟ කඩ කුළී අය කර ගත යුතුය |

(ඈ) වෙනත් ආදායම්

------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රීරෝද රථ ගාස්තු ආදායම රු.563,400 ක් ලෙසට ඇස්තමේන්තු කර තිබුණ ද, සත්‍ය ආදායම රු.106,300 ක් හෙවත්, ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 19 ක් වූ බැවින්, හිඟ ගාස්තු අය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, හිඟ ත්‍රීරෝද රථ ගාස්තුවලින් කපා හැරීම සඳහා හඳුනාගත් රු.992,100 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ග ගත්ත ද, පවතින ආර්ථික තත්ත්වය මත හිඟ ආදායම් අය කර ගැනීමට නොහැකි වූ බව | හිඟ ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර ගත යුතු වීම හා කපා හැරීමට හඳුනාගත් ශේෂ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම |